# මේජර් ජනරාල් ජයසූරිය නව හමුදාපති

## ජෙනරාල් පොන්සේකාට ඉහළ තනතුරක් සමරසිංහ නාවික හමුදාපති



**යු**ද හමුදාපති ජනරාල් සරත් ෆොන්සේකා මහතා, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ලෙස ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් පත් කරනු ලැබ සිටී.

ඒ අනුව නව හමුදාපතිවරයා ලෙස වන්නි ආඥාපති මේජර් ජනරාල් ජගත් ජයසූරිය මහතා පත් කරනු ලැබ ඇත. මේ අතර නාවික හමුදාපති අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතා ජාතික ආරක්ෂාව පිළිබඳ ජනාධිපති උපදේශක ලෙස පත්ව සිටී.

ඔහුගෙන් පුරප්පාඩු වූ නාවික හමුදාපතිධුරයට නාවික හමුදා මාණ්ඩලික ප්‍රධානී රියර් අද්මිරාල් තිසර සමරසිංහ මහතා පත් කරනු ලැබ ඇත.

මෙම පත්වීම් මෙමස 15 වැනිදා සිට ක්‍රියාත්මක වේ.

### ජනරාල් සරත් පොන්සේකා

දෙවැනි ලුතිනන් වරයකු ලෙස ජනරාල් සරත් පොන්සේකා මහතා **1970** දි යුද හමුදාවට බැඳුණේය. අම්බලන්ගොඩ ධර්මාශෝක හා කොළඹ ආනන්ද විදුහල්හි ආදි ශිෂ්‍යයෙකි.

යුද බිම පළපුරුදු හා පරිණත නිලධාරියෙකු වන ඔහු මෙහෙයුම් රැසකට සහභාගි විය. මිරිසුවිල්, වවුනියා, යාපනය, කයිට්ස්, මණ්ඩතිවු හා මඩකළපුවේදී සේනායක අණ දෙන නිලධාරියකු වූ ඔහු වරක් කිලිනොච්චියේ සේනාංකාධිපති වශයෙන්ද කටයුතු කළේය.

බංගලි දේශය, ඉන්දියාව හා මහා බ්‍රිතාන්‍යයේ උසස් පාඨමාලා හැදෑරූ ඔහු තිස් අවුරුදු බෙදුම්වාදී යුද්ධය පසුගිය මැයි **18** වැනිදා අවසන් කිරීමෙන් පසු මේජර් ජනරාල් ධුරයේ සිට ජනරාල් ධුරය දක්වා උසස් කෙරිණ.

ජනරාල් සරත් පොන්සේකා අනෝමා සමග විවාහ වී සිටියි. අප්සරා හා අපර්ණා ඔවුන්ගේ දූවරුන් දෙදෙනාය.

ලබන බදාදා (15) සිට ජනරාල් සරත් පොන්සේකා එම තනතුරට පත්වනුයේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන ගුවන් මාර්ෂල් ඩොනල්ඩ් පෙරේරා විශ්‍රාම යාම නිසාය.

### මේජර් ජනරාල් ජගත් ජයසූරිය

මේජර් ජනරාල් ජගත් ජයසූරිය 1978 දි හමුදාවට බැඳුණේය. 1980 දි දෙවැනි ලුතිනන් වරයෙක් විය. යුද හමුදාවේ විවිධ තනතුරු දැරූ ඔහු 1998 ජය සිකුරු මෙහෙයුමේදී බරපතල තුවාල ලැබීය.

ජයසූරිය මහතා පාකිස්තානය, ඉන්දියාව, ඇමෙරිකාව හා චීනයේ උසස් පාඨමාලා හැදෑරීය. 1990 දී යාපනයේ නව වැනි සේනාංකයට එක්වූ ඔහු 1991 දී නිලධාරි අධ්‍යයන කේන්ද්‍රයේ ප්‍රධාන



**නව හමුදාපතිවර ජගත් ජයසූරිය**

උපදේශක විය. 1996 දී යුද හමුදා ලේකම්වරයා විය. 2005 දී පනස් දෙවැනි බළසේනාවේ සේනාංකාධිපති වූ ඔහු 2007 දී වන්නි ආඥාපති වූයේය.

මේජර් ජනරාල් ජයසූරිය උත්තම සේවා පදක්කම, දේශපුත්‍ර සම්මානය, පූර්ණ භූමි පදක්කමද දිනා සිටියි. ඔහු ලබන බදාදා නව පදවියේ වැඩ බාර ගනියි

*ඇමරිකාව සහ ඉන්දියාව යන රටවල ජාතික ආරක්ෂාව පිළිබඳ උපදේශක රටේ බලවත් පුද්ගලයෙකු ලෙස පිළිගැණේ. ඒ අනුව යමින් ශ්‍රීලංකාව ද ආරක්ෂාව පිළිබඳ ජනාධිපති උපදේශකවරයා ලෙස අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතා පත්කර ඇත.*


Duke's Court Travel
DUKE'S COURT TRAVEL
Fly to Colombo
SriLankan Airlines fr £350 + Taxes
Qatar Airways fr £225 + Taxes
Kuwait Airways fr £200 + Taxes
Emirates fr £545 + Taxes
Kingfisher Airlines fr £350 + Taxes
Note: All fares mentioned are low season / terms & conditions apply.
www.easy-flights.tv
020 8748 3535 / 0800 112 0535
AITO IATA
204 King Street, London W6 0RA


## ජනහඬ පදනමෙන් අගනා පරිත්‍යාගයක්



**බ**ටහිර ලන්ඩනයේ හවුන්ස්ලෝ පෙදෙසේ ආරම්භකර ඇති දේශප්‍රේමී ශ්‍රීලාංකික ජනහඬ පදනම බොහෝ සුබසාධන කටයුතුවල නිරත සංවිධානයකි. මේ නොබෝදා ජනහඬ පදනම විසින් ශ්‍රීලංකාවේ ආබාධිත රණවිරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ඉතා අනර්ඝ වර්ගයේ රෝද පුටු **59** ක් පරිත්‍යාග කරන ලදී. යුදහමුදාවේ සේවා වනිතා ඒකකයට බාරදුන් ඒ රෝද පුටු සංකේතවත් ලෙස යුදහමුදා රෝහලේදී එම රණ විරුවන් වෙත පිළිගැන්වූ අන්දම මෙම පින්තූරයෙහි දැක්වේ. රණවිරුවන් වෙත පිළිගන්වා ඔවුන් එහි හිඳුවගෙන යන අයුරු මෙම පින්තූර යෙන් දැක්වේ.

ශ්‍රීලංකාවට ගොස් මෙම මහඟු අවස්ථාවට සහභාගි වූවන් අතර හවුන්ස්ලෝ ජනහඬ පදනමේ සභාපති ද, සංවිධාන කාර්‍ය මණ්ඩලයට අයත් නන්දාවතී, තිසිතා ප්‍රනාන්දු, ජයන්තා ප්‍රනාන්දු, චමත් ද සිල්වා සහ පියසේන බෝපගේ යන මහත්ම මහත්මීහු වෙති.


ඔබේ මුදල් අදම යවන්න - අදම ලබාගන්න
FAST CASH
SEND TODAY - COLLECT TODAY
Transfer Fees From only £5
June Offer!
FREE Money Transfer for You + Friend
* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය
COMMERCIAL BANK BOC HNB HSBC
සම්පත් බැංකුව SampathBank PEOPLE'S BANK Standard Chartered MCG දින 7ම විවෘතයි
www.efastcash.biz
020 8886 4488
Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT

Sanath Jayasuriya
Global Brand Ambassador MCG